
ඔබටම සාමය වේවා

# ඔබට සාමය වේවා

සාමය - කෙතරම් සුමිහිරි සුවදායක වදනක්ද! මිනිස් හදවත සුසුම්ලමින් ආශාකරන්නකි සාමය. මිලියන ගනනක ජනයා එය සොයන නමුත් සැතපුම් මිලියන ගණනක් දුර්ස්තවී සිටින්නාක් ලෙසයි එය පෙනෙන්නේ. මුදලින් මිලයට ගත නොහැකි, ප්‍රඥාවට සොයාගත නොහැකි, නම්බුනාමවලින් ආකර්ශනය කළ නොහැකි දෙයකි සාමය. ඔබද සාමය සොයනවා ඇති කිසිම සාර්ථක බවක් නැතිව. මෙය නොමැති කමින් ඔබ මොනතරම් අවස්ථාවන්හි ඔබගේ ආතතියට අන් අයවෙත දොස්පවරන්න ඇතිද, නැතහොත් තම ජීවිතය පවා එය නිසා නැතිකරගන්න තැත් කර ඇත්ද? මත්ද්‍රව්‍ය වලින් එය ලබන්න හදපු වාරද ඇත; එම ද්‍රව්‍යයන්හි බලපෑම නැතිවිගන යනවිට පැතුවාවූ සාමයද ගිලිහියනබව ඔප්පුවී ඇති. සමහරු යෝගා හෝ ලෝකෝත්තර භාවනා දෙසට හැරෙති. මේ පිළිබඳව මෑතකදී කල වෛද්‍ය පරීක්ෂණයකින් හෙළිවූයේ මෙම භාවනා මාස 18කට වැඩියෙන් නියුතුවූ අයහට එසේ භාවනා නොකළ අයට මෙන් දෙගුණයක මානසික ආහාධ ඇතිවූ බවයි. තවත් අය තපස් රැකීමට යොමු වූවත් අවසානයේදී නොසන්සුන්භාවය ඇත්තේ අන්අය තුල නොව තමන් තුලම බව වටහාගනී. ලෝකයාගෙන් වෙන්වී සිටි කාලයේදී සිදුවූයේ තමන් තුලම තිබූ දූෂිතභාවය මුහුණට මුහුණලා සම්මුඛ වීමය. අපගේ දෛනික ගැටලුකාරී තත්වයන් අභිබවන්නට තමන්ට සාමය හෝ ශාන්තිය අත්කරගන්ට නොහැකි නම් ජීවිතයේ අරමුණ කුමක්ද?



අපි මේ පොත් පිංච ඔබට ඉදිරිපත්කරන හේතුව නම් ඔබට අව්‍යාජ රඳා සිටින සාමයක් ලබාදිය හැකි එකම තැනැත්තා ඔබට හඳුන්වා දෙන්නටයි. ''සාමය ඔබට දෙන්නෙමි; මගේ සාමය ඔබවෙත තබන්නෙමි...ඔබගේ සිත් නොකැළඹේවා, බියට පත් නොවේවා.'' යයි ඔහු පවසයි. මෙවදන් හුදෙක් හිස් වදන් නොව ඔබට ප්‍රේමකරන බව ඔප්පුකරන්නට ඔබ වෙනුවෙන් තම දිවියම පුදා ඔබගේ සුභසිධිය ගැන තකන තැනැත්තාගේ වචනයන්ය. කිසිවකුටත් තමන් තුළ නැති සාමයක් අන් අයෙකුට දිය නොහැකිය. සාමය සතු කරගත් එය ඔබට දෙන්නට පොරොන්දුවූ කෙනෙක් සිටි. ඔහුට දී ඇති නම සාමයේ කුමාරයාණෝ යන්නය. ඔහුගේ නම යේසුස් ය.



ඔබ කියනවා ඇති, ''ඒත් මේ යේසුස් මට සැබෑ නොවේ; මට දකින්නටවත් බැරි කෙනෙක්ගෙන් මා යමක් ලබන්නේ කෙසේද?'' යේසුස් ඔබට සැබෑ නම් දැනටමත් ඔබට මෙම සාමය අත්වී තිබිය යුතු ය. එතුමා ඔබට සැබෑ නොවීමට හේතුව නම් ඔහු සහ ඔබට ඔහු දෙන්නට සූදානම් සාමය ඔබගෙන් වෙන් කරන එක්තරා දෙයක් ඇත. ඒ 'දෙය' නම් ඔබගේම පාපය වේ. අපගේ අභ්‍යන්තරයෙන්ම අපි දන්නවා හරි වැරදි මොනවාද කියා. යම් යම් දේ නොකළ යුතු බව පවසන අප තුල ඇති හෘදය සාක්ෂියේ හඬ අපි නොසලකා හරිනවිට අපි ඇත්ත වශයෙන්ම අපට තම සාමය දීමට බලා

සිටින තැනැත්තාගේ හඬට බිහිරි වීමකි කරන්නේ. මෙහි උපුටා  දැක්වෙන වදන් ගැන ටිකක් හිතන්න: ‘’ඔබ මගේ හඬට අවනත වුනා නම් ඔබේ සාමය ගංගාවක් මෙන් ගලා බැසීමට තිබුණි, ඔබේ දමිටුකම ‘’මුහුදේ රැළි මෙන්’’ වන්නට තිබුණි.’’ ‘’අපි අපේ පාප කියාදෙමු නම් අපගේ පාප කමාකොට සියලු අදමිටුකම්වලින් අප පවිත්‍ර කරන්න එතුමන් විශ්වාසීව සහ යුක්තිසහගතව සිටින සේක’’.



දැන් එය ඇත්තේ ඔබ අතේය. ඔබට නියත වශයෙන් සාමය අවශ්‍ය නම් ඔබ කළ යුතු වන්නේ ඔබ විසින් ඔබේ ජීවිතයේ වැරදි කියා ඔබ දන්නා සෑම දෙයකින්ම හැරී තමන්ට සමාව දෙන ලෙස යේසුස්ගෙන් ඉල්ලන්න. ඔබ කර ඇති කවර පාපයක් වුවද කමා කිරීමට එතුමන් සතුව හැකියාව සහ උවමනාවද ඇත, මන්ද ඔබගේත් මගේත් පාප වෙනුවෙන් කුරුස ගසේදී තම දිවිපුදා ඒවාට දඬුවම් වින්ද නිසා. එසේනම් දෙවියන් වහන්සේ ඔබෙන් ඉල්ලා සිටින කවර දෙයකට වුවද කීකරු වන්නට ඔබ තීරණයක් ගන්න. ඔබ එසේ කළහොත්, ඔබට නැණ නුවන ඉක්මවායන නියම සාමය ඔබ වෙලා ගනු ඇත. එම සාමය කවදාවත් ඔබ හැර යන්නේ නැත. ඔබේ පාපය ඔබෙන් ඉවත්වූ විට සාමයේ කුමරු වන යේසුස් ඔබට සැබෑ වේ.

සාමය සහ රෝගයෙන් මිදීම සියල්ල එක ගොනුවක්සේ

ඔබට ලැබෙන්නේය. යේසුස් වදවිඳ කුරුසගසේ දිවිපිදුවේ අප පාපවලින් ගලවගන්නට පමණක් නොව ලේඩ රෝගවලින්ද අප මුදවගන්නටත්ය. ඔබ එතුමා ඔබගේ ගැලවුම්කරු සහ ස්වාමින් ලෙස පිලිගත් කළ, එතුමන් ඔබ ආත්මයට සමාව සහ සාමය රැගෙන එනවා පමණක් නොව, සිරුරට සුවයත් ගෙනදේ. මෙම අත්දැකීම ලත් දාවිත් රජු මෙසේ ගයන කළේය:''මගේ ආත්මය ස්වාමින්ට ප්‍රසංසා කරන්න; එතුමන්ගේ උපකාර කිසිවක් අමතක නොකරන්න; ඇතුම ඔබගේ සියලු පාප කමාකර, සෑම රෝගයක්ම  සුවකරන  සේක.'' ඔබ සාමයේ කුමරු යේසුස් මුණගැසී එතුමන්ගේ සාමය ලබාගත් කළ, බය, කනස්සල්ල සහ වධවින්දන ඔබේ හදවතින් නොදැනුවත්වම පහවී යන බව මැනවින් දැනගන්න.  එමෙන්ම ඔබේ දිවියෙන්ද මේ යුධ හා වෛරයෙන් පිරුණු ලොවට යම් පමණක සාමයක් සහ ශාන්තියක් ගෙනෙන්නට ඔබට හැකිවනු ඇත.



**යාඥාව :**

**''ජේසුස් ස්වාමිනි, ඔබ සාමයේ කුමාරයාණෝ. මට ඔබගේ සාමය අවශ්‍යයයි. මා දන්නවා මගේ පාප තමයි ඔබෙන් මා වෙන් කරන්නේ. කරුණාකර මගේ පාප කමාකොට මගේ පාපිෂ්ට හදවත ඔබේ අනගි ලෙයින් සෝදා පිරිසිඳු කරන්න. අද මම ඔබ මගේ දෙවියන් වහන්සේ සහ ගැලවුම්කරුවාණෝ ලෙස පිලිගනිමි. ඔබ කියන  ඕනෑම දෙයක් කිරීමට මම සුදානම්. මට උදව් වන්න. මා සුවකර ඔබගේ සාමය මට දුන මානව. ආමෙන්.'**

